# අභ්‍යන්තර කටයුතු ඒකකය

ජනාධිපති ලේකම් විසින් නිකුත් කරන ලද අංක PS/SB/Circular/2/2025 හා 2025 පෙබරවාරි 18 දිනැති චක්‍රලේඛය අනුව වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර කටයුතු ඒකකය පිහිටුවන ලදී.

<u>**පැමිණිලි ඉදිරිපත් කිරීම**</u>

වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ සේවයේ නියුතු නිලධාරියෙකු සම්බන්ධයෙන් හෝ වෙළඳ නාවික ලේකම් කාර්යාලය විසින් සපයනු ලබන සේවාවන් සම්බන්ධයෙන් හෝ වන පැමිණිලි මෙන්ම එහි සේවා සැපයීම වැඩි දියුණු කිරීම සඳහා යෝජනා පහත සඳහන් මාර්ග ඔස්සේ අභ්‍යන්තර කටයුතු ඒකකයට ඉදිරිපත් කළ හැකිය.

විද්‍යුත් ලිපිනය: iau.dgmss@gmail.com

WhatsApp: 070 1107787

දුරකථන: 011 2441429

තැපැල් ලිපිනය: අභ්‍යන්තර කටයුතු ඒකකය, නො. 79, ටෙක්නිකල් හංදිය, මරදාන පාර, කොළඹ 10

QR කේතය:

**Public Complaints**
⇧
Click Here

<u>**අභ්‍යන්තර කටයුතු ඒකකයේ ප්‍රධාන අරමුණු**</u>

1. ආයතනය තුළ දූෂණය වැළැක්වීම සහ සුපිළිපන්න සංස්කෘතියක් වර්ධනය කිරීම.

2. ආයතනයේ සියලුම ක්‍රියාකාරකම්වල විනිවිදභාවය සහ වගවීම සහතික කිරීම සහ ආයතනික ක්‍රියාකාරකම් සහ තීරණ සම්බන්ධ තොරතුරු වෙත මහජන ප්‍රවේශය සහතික කිරීම.

3. ආයතනය තුළ සදාචාරාත්මක පාලනය ප්‍රවර්ධනය කිරීම.

4. විෂමාචාර වාර්තා කිරීම දිරිගැන්වීම, තොරතුරු හෙළිකරන්නන් ආරක්ෂා කිරීම සහ රහස්‍යභාවය පවත්වා ගැනීම සඳහා ආරක්ෂිත සහ ප්‍රවේශ විය හැකි ක්‍රමවේදයක් සකස් කිරීම.

5. නීතිය ක්‍රියාත්මක කරන ආයතන සහ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සමග සහයෝගයෙන් නීති බලාත්මක කිරීමට සහය වීම.

## අභ්‍යන්තර කටයුතු ඒකකයේ වගකීම් හා කාර්යයන්

1. ආයතනය තුළ පවතින පද්ධතිමය බාධාවන් (systemic bottlenecks) හඳුනාගැනීම සඳහා වත්මන් ක්‍රියාපටිපාටි සහ චක්‍රලේඛ පරීක්ෂා කිරීම සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා ඒවා සරල කිරීම.

2. දූෂණ අවදානම් ඇගයීම් (Corruption Risk Assessment) සිදු කිරීම මගින් ආයතනය තුළ දූෂණයට හා සදාචාර විරෝධී හැසිරීම්වලට ගොදුරු විය හැකි ක්ෂේත්‍ර හඳුනාගැනීම සහ ඉලක්කගත වැළැක්වීමේ පියවර ගැනීම.

3. ආයතනයේ අවශ්‍යතාවයට ගැලපෙන පරිදි සකස්කරන ලද නිශ්චිත දූෂණ විරෝධී අරමුණු සහ උපායමාර්ග ඇතුළත් ආයතනික සුපිළිපන්න ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කිරීම.

4. ජාතික දූෂණ විරෝධී ක්‍රියාකාරී සැලැස්ම සමග ආයතනික ප්‍රතිපත්ති සහ භාවිතයන් පෙළගස්වමින් ජාතික දූෂණ විරෝධී උපායමාර්ගවලට අනුකූල වීම.

5. 2023 අංක 9 දරණ දූෂණ විරෝධී පනත ඇතුළු ජාතික හා ජාත්‍යන්තර දූෂණ විරෝධී නීති සමග ආයතනයේ අනුකූලතාව ඇගයීම සඳහා අනුකූලතා සමාලෝචන (Compliance Assessments) සිදු කිරීම සහ වැඩිදියුණු කළ යුතු ක්ෂේත්‍ර හඳුනා ගැනීම.

6. සියලුම රාජ්‍ය නිලධාරීන් සහ සේවානියුක්තිකයින් සඳහා වත්කම් ප්‍රකාශන අවශ්‍යතාවලට අනුකූල වීම සහතික කිරීම සහ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා නියෝග සහ 2023 අංක 9 දරණ දූෂණ විරෝධී පනතට අනුකූලව බැදියාවන් අතර ගැටුම් කළමනාකරණය කිරීම.

7. ආයතනය තුළ දූෂණ සහ සදාචාර විරෝධී හැසිරීම් සම්බන්ධ පැමිණිලි භාරගැනීම සහ කළමනාකරණය කිරීම සඳහා ආරක්ෂිත පද්ධතියක් ස්ථාපිත කිරීම, එවැනි සියලුම පැමිණිලි සම්බන්ධයෙන් අදාළ නිලධාරීන් හෝ ඒකක විසින් කඩිනම් කටයුතු කරන බවට සහතික විම සහ විනිවිදභාවය සහ වගවීම සහතික කරමින් විමසීම් සිදුකරන අදාළ පාර්ශවකරුවන් වෙත නිරන්තර යාවත්කාලීන කිරීම් ලබා දීම. අවශ්‍ය පරිදි, දූෂණ විරෝධී පනත යටතේ විමර්ශනය සඳහා අදාළ කරුණු සොයාගැනීම් හෝ තොරතුරු අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත යොමු කිරීම.

8. ආයතන විසින් සපයනු ලබන සේවාවන් විස්තර කෙරෙන පුරවැසි ප්‍රඥප්තියක් සංවර්ධනය කර ප්‍රකාශයට පත් කිරීම.

9. රාජ්‍ය නිලධාරීන් විසින් පිළිපැදිය යුතු ප්‍රමිතිගත ආචාර ධර්ම සංග්‍රහයක් ඇතුළුව, සදාචාරාත්මක පාලන ප්‍රවර්ධනය කරන ප්‍රතිපත්ති ස්ථාපිත කිරීම සහ බලාත්මක කිරීම.

10. දූෂණ විරෝධී මූලධර්මවලට කැපවී සිටීමට අභිප්‍රේරණයක් ලෙස කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සහ දැනුවත් කිරීම ඇතුළු අනෙකුත් ක්‍රියාමාර්ග ගැනිම.

11. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සහ ජාතික දූෂණ විරෝධී රාමුව මගින් මෙහෙයවනු ලබන සුපිළිපන්න ඇගයීම් ක්‍රියාවලීන් සඳහා ආයතනය සහභාගී වන බව සහ ඒ සමග පෙළගැසෙන බව සහතික කරමින්, ජාතික දූෂණ විරෝධී සුපිළිපන්න ඇගයීම් (National Anti-Corruption Integrity Assessment) සඳහා ආයතනික කේන්ද්‍රස්ථානය ලෙස ක්‍රියා කිරීම.

12. ඒකකයේ රාජකාරි ක්‍රියාත්මක කිරීමේදී අඛණ්ඩ මගපෙන්වීම් සහ සහාය ලබා ගැනීම සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සමග සම්බන්ධතා පවත්වා ගැනීම.

13. අභ්‍යන්තර කටයුතු ඒකකයෙහි ක්‍රියාකාරකම්, දූෂණ විරෝධී මුලපිරීම් වල ප්‍රගතිය, මුහුණ දෙන අභියෝග සහ ඉදිරි ක්‍රියාමාර්ග සඳහා නිර්දේශ සාරාංශගත කරමින් කාලානුරූපී සහ වාර්ෂික වාර්තා සකස් කිරීම.

14. පුද්ගලික අංශයේ පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් සුපිළිපන්නතාව වර්ධනය කිරීම සඳහා වන සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

**<u>අභ්‍යන්තර කටයුතු ඒකකයේ සාමාජිකත්ව සංයුතිය</u>**

| ඒකකයේ තනතුර | නම | ස්ථිර තනතුර |
|---|---|---|
| ඒකක ප්‍රධානී | එස්.ඩී.එස්.ඒ රූපසිංහ මයා | අධ්‍යක්ෂ (පාලන) |
| සුපිළිපන්න නිලධාරියා | කේ.එල්.නිශාන්ති මිය | ගණකාධිකාරී |
| සාමාජික | පී.වී.ටී.පී චන්දන මයා | අධ්‍යක්ෂ (ඉංජිනේරු) |
| සාමාජික | එම්.යූ.අයි. පීරිස් මයා | අධ්‍යක්ෂ (නාවික ) |
| සාමාජික | ඒ.එම්.ඒ.බී.අතපත්තු මයා | අධ්‍යක්ෂ (බලපත්‍ර) |
| සාමාජික | අයි.අයි.එම්.සී.ඉලංකෝන් මයා | සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) |
| සාමාජික | සී.ඒ.සී.සිල්වා මයා | සහකාර රාජ්‍ය නෞකා සමීක්ෂක(නැව් තට්ටු) |
| සහාය කාර්ය මණ්ඩලය | එම්.ආර්.එදිරිසිංහ මයා | සහකාර නැව් ගමන් නිලධාරී |
| සහාය කාර්ය මණ්ඩලය | ටී.ජී.එන්.තුෂාරි මිය | සහකාර නැව් ගමන් නිලධාරී |
| සහාය කාර්ය මණ්ඩලය | ඩී.එස්.ඩී.එදිරිසිංහ මිය | ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී |
| සහාය කාර්ය මණ්ඩලය | ඩබ්. කසුන් ගමින්ද ප්‍රනාන්දු මයා | සංවර්ධන නිලධාරී |
| සහාය කාර්ය මණ්ඩලය | එම්.ජී.එස්.ඩී.එස්.බණ්ඩාර මයා | කළමනාකරණ සේවා නිලධාරී |
| සහාය කාර්ය මණ්ඩලය | ආර්.පී.ජේ.කේ.සමරකෝන් මිය | සංවර්ධන නිලධාරී |
| සහාය කාර්ය මණ්ඩලය | ජී.ජී.එම්.වයි.සුමනරත්න මිය | කළමනාකරණ සේවා නිලධාරී |
| සහාය කාර්ය මණ්ඩලය | ඩබ්ලිව්.ජේ.එම්.පි.ඒ.ඒ.සි. සිල්වා මිය | කළමනාකරණ සේවා නිලධාරී |
| සහාය කාර්ය මණ්ඩලය | අයි.ආර්.ඩී.සංජීව මයා | රියදුරු |
| සහාය කාර්ය මණ්ඩලය | එස්.ටී.මුණසිංහ මයා | කාර්යාල කාර්ය සහායක |